**ශීර්ෂ 177 - සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේවූ දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

---

මෙම වාර්තාවේ 1 ඡේදයේ සිට 2 ඡේදය දක්වා අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ සිට එක් එක් ශීර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

**1. අමාත්‍යාංශ යටතේ ඇති දෙපාර්තමේන්තුව**

| **ශීර්ෂ** | **දෙපාර්තමේන්තුව** |
|---|---|
| 206 | සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව |

**1.1 විගණන විෂය පථය**

ඉහත 1 ඡේදයේ සඳහන් සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේතුවේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව අමාත්‍යාංශයේ ලේකම්වරයාට හා දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වෙත පහත සඳහන් දිනවල නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචන හා පරීක්ෂණයන්ගේ විෂය පථය හා ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

| **ශීර්ෂය** | **අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව** | **කළමනාකරණ විගණන වාර්තාව නිකුත් කළ දිනය** |
|---|---|---|
| 177 | සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය | 2015 ඔක්තෝබර් 09 |
| 206 | සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | 2015 සැප්තැම්බර් 23 |

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම්**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශ හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 1,913.69 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,556.17 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් රු.මිලියන 294.58 ක සිට රු.මිලියන 62.94 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 22 ක සිට සියයට 11 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් පැවතුණි. විස්තර පහත දැක්වේ.

| **ශීර්ෂය** | **2014 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| 177 | 1,322.34 | 1,027.76 | 294.58 | 22 |
| 206 | 591.35 | 528.41 | 62.94 | 11 |
| **එකතුව** | **1,913.69** | **1,556.17** | **357.52** | **19** |

**2.2 අත්තිකාරම් ගිණුම්**

**2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 17701 | 32.00 | 21.92 | 14.00 | 16.83 | 110.00 | 68.81 |
| 20601 | 19.00 | 15.14 | 8.00 | 11.09 | 60.00 | 43.28 |

**2.3 පොදු තැන්පතු ගිණුම්**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු. මිලියන 31.24 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | තැන්පත් ගිණුම් අංකය | 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. මිලියන |
| සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය | 6000/0000/00/0015/0054/000 | 17.17 |
| සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0088/000 | 14.07 |
| **එකතුව** | | **31.24** |

**2.4 විගණන නිරීක්ෂණය**

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ හා එම අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවල සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවල ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ සිට 4 ඡේදය දක්වා වූ ඡේදවල සඳහන් කර ඇත.

**3. ශීර්ෂය 177 - සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම.**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (i) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |
| (ii) | දෙපාර්තමේන්තු විසර්ජන (සම්මත වැය) ලෙජරය | මුදල් රෙගුලාසි 447 | පවත්වා නොතිබුණි. |
| (iii) | පොදු තැන්පත් ලෙජරය | මුදල් රෙගුලාසි 569 | විධිමත් පරිදි යාවත්කාලින කර නොතිබුණි. |

**3.2 විගණන විමසුම්වලට පිළිතුරු දීම.**

අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 03 කට සහ ඉකුත් වර්ෂවලදී නිකුත් කළ විගණන විමසුම් 01 කට 2015 ජුලි 20 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාල ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.50,041,284 ක් විය.

**3.3 විසර්ජන ගිණුම**

**3.3.1 අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 4 ක් සඳහා සළසා තිබුණු රු.62,500,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනය ඉතිරිවී තිබුණි.

(ආ) වැය විෂයයන් 11 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හා ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය, එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 40 සිට සියයට 95 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ඈ) පැරැලිය සුනාමි පර්යේෂණ ආයතනය හා සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා රු.මිලියන 50 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර ඉන් රු. මිලියන 20 ක් වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණි. ඒ අනුව රු.මිලියන 30 ක්වූ ඉතිරි ශුද්ධ ප්‍රතිපාදනයෙන්ද සියයට 80 කට වැඩි ප්‍රමාණයක් ඉතිරි කර තිබුණි.

(ඇ) ශිල්ප ගම්මාන වැඩසටහන සඳහා සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 8 ක ප්‍රතිපාදන සළසා ගෙන තිබුණු අතර ඉන් සියයට 88 ක ප්‍රමාණයක් උපයෝජනය කර නොතිබුණි. ඉකුත් වර්ෂයේදී මෙම වැඩසටහන සඳහා සළසාගෙන තිබූ ප්‍රතිපාදනයෙන් සියයට 86 ක ප්‍රමාණයක් වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණි.

(ඉ) සංස්කෘතික මධ්‍යස්ථාන කාර්යාල කාර්ය සහායකයින් හා මුරකරුවන් 364 දෙනෙකු වෙනුවෙන් නිල ඇඳුම් දීමනාව ගෙවීම සඳහා රු. 1,456,000 ක ප්‍රතිපාදන සළසාගෙන නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී එම දීමනාව ගෙවීමට නොහැකි වී තිබුණි.

### 3.4 පොදු තැන්පතු ගිණුම

පොදු තැන්පත් ගිණුමේ වර්ෂ 2 කට වැඩි කාලයක පැවැත එන එකතුව රු.2,790,464 ක්වූ තැන්පතු 3 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 3.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

විෂය අංක 17701 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීමට හිඟහිටි තිබුණු ශේෂවල එකතුව රු.3,948,942 ක් විය. එයින් රු.1,503,518 ක් වර්ෂ 1 සිට වර්ෂ 10 දක්වා කාල පරාසයකට අයත් විය. එම හිඟහිටි ණය ශේෂ 2014 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

### 3.6 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

#### අභ්‍යන්තර විගණනය.

අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය විසින් අමාත්‍යාංශයේ හා ඒ යටතේ පවත්නා ආයතනවලට අදාලව අභ්‍යන්තර විගණන කටයුතු සිදු කර තිබුණි. අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂය සඳහා මුළු මිනිස් ශ්‍රම පැය 5500 කින් මිනිස් ශ්‍රම පැය 2900 ක් අමාත්‍යාංශය යටතේ වන අනෙකුත් ආයතනවල අභ්‍යන්තර විගණන කටයුතු සඳහා යෙදවීමට සැලැසුම් කර තිබුණත්, එම කටයුතු සැලැසුම් කළ පරිදි ඉටු කර නොතිබුණි.

සමාලෝචිත වර්ෂයේදි සිදුකර තිබූ අභ්‍යන්තර විගණන පරීක්ෂණ ප්‍රධාන වශයෙන්ම ප්‍රාදේශීය සංස්කෘතික මධ්‍යස්ථාන කෙරෙහි යොමු කර තිබුණි.

### 3.7 වත්කම් කළමනාකරණය

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

#### (අ) ඌන උපයෝජිත වත්කම්

මහජන ප්‍රදර්ශනයට චිත්‍රපටි මුදා හැරීමට පෙර ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලයේ පරීක්ෂාවට ලක් කරනු ලැබේ. චිත්‍රපට පූර්ව දර්ශන නැරඹීම සඳහා ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය සතුව කුඩා සිනමාහලක් පැවතියද එම සිනමාහලේ Digital Cinema Package වර්ගයේ නිෂ්පාදිත චිත්‍රපට නැරඹීමේ පහසුකම නොතිබුණි. එම නිසා බාහිර ආයතනවලට අයත් සිනමාහල්වල එම පූර්ව චිත්‍රපට දර්ශන නැරඹීමට සිදුවී තිබුණි. 2014 ඔක්තොම්බර් 31 දින දක්වා ලැබී තිබූ මුළු චිත්‍රපට 147 කින් චිත්‍රපට 99 ක් එම (DCP) වර්ගයේ ඒවා වීම හේතුවෙන් මෙම කුඩා සිනමා ශාලාව ඌන උපයෝජිතව පැවැතුණි.

#### (ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

2014 ඔක්තෝම්බර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2015 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, අමාත්‍යාංශය විසින් එම වාර්තා 2015 මැයි 31 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2013 වර්ෂය වෙනුවෙන් පවත්වා තිබුණි.

#### (ඇ) බේරුම් නොකළ බැරකම්

අමාත්‍යාංශය විසින් 2014 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු.43,396,614 ක් විය. මහනුවර ප්‍රසංග කලා රඟහල ඉදිකිරීම සඳහා ඉඩමෙහි මිනුම්දෝරු සැලැස්ම සකස් කිරීම වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරිය වෙත ගෙවිය යුතු රු.1,234,800 ක මුදල මෙම බැරකම් තුළ ඇතුළත් කර නොතිබුණි.

**3.8 අනුකූල නොවීම්**

**-------------------**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**------------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| **(අ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| | XV පරිච්ඡේදයේ 10.4 වගන්තිය | - | 2014 වර්ෂයේ තායිලන්තයේ වෙසක් සැමරීමේ සංචාරය සඳහා දිවයිනෙන් බැහැර යාමට අනුමැතිය ලබා ගැනීමට වූ ලිපිය ගමන පිටත්වීමට දින 2 කට පෙර ඉදිරිපත් කර තිබුණි. |
| **(ආ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| | (i) මුදල් රෙගුලාසි 115 | 22,154,940 | සමාලෝචිත වර්ෂයේ සංස්කෘතික මධ්‍යස්ථානවල පුහුණු වැඩසටහන් පැවැත්වීම වෙනුවෙන් රු.22,154,940 ක සම්පත්දායක දීමනා ගෙවා නොතිබුණි. මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු නොකිරීම නිසා මෙම ඇතැම් බැරකම් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පැවැතුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 94 හා 447 | 43,396,611 | බැරකම්වලට එළඹීමේදි හා බැරකම් ගිණුම්ගත කිරීමේදී මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| | (iii) මුදල් රෙගුලාසි 128, 207(2), 138(1), හා 447(1) | 6,260,535 | 2014 සැප්තැම්බර් මාසයේදී ගෙවීම් වවුචර් 29 කින් කරන ලද වියදම්, අදාළ වැය විෂයයන් යටතේ ගිණුම්ගත නොකර සංස්කෘතික මධ්‍යස්ථානවල පුහුණු වැඩසටහන් වැය විෂයේ හා ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ වැය විෂය යටතේ ගිණුම්ගත කර තිබුණි. |

**(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය**

| | | |
|---|---|---|
| මාර්ගෝපදේශ 4.3 හා 4.3.2 | 15,790,806 | මාදම්පේ සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීමට අදාලව මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණි. දිස්ත්‍රික් ලේකම් හෝ ප්‍රාදේශීය ලේකම් විසින් වරින්වර පිළියෙල කර සංශෝධනය කරනු ලබන පිරිවැය ඇස්තමේන්තු අනුව ඉදිකිරීම් කටයුතු සිදුකර තිබුණි. |

**3.9 දේශීය මූල්‍යකරණය මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

දේශිය මූල්‍යකරණයන් මගින් ව්‍යාපාති ක්‍රියාත්මක කිරීමේදි පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

**(අ) අයිතිය පවරා ගැනීමෙන් තොරව අමාත්‍යාංශ ප්‍රතිපාදන උපයෝජනය කිරීම**

භූමියේ හෝ ගොඩනැගිලිවල හිමිකාරීත්වය අමාත්‍යාංශයට පවරා නොගෙන පහත සඳහන් ව්‍යාපෘතිවල ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | 2014 දෙසැම්බර් 31 දිනට වියදම | වෙනත් කරුණු |
|---|---|---|---|
| | රු. | රු. | |
| මාදම්පේ සංස්කෘතික මධ්‍යස්ථානය | 15,790,806 | 7,709,560 | භූමියේ නිරවුල් අයිතිය විධිමත්ව පවරාගෙන නොතිබුණි. |
| සමන්තුරේ සංස්කෘතික මධ්‍යස්ථානය | 2,275,000 | 2,275,000 | භූමිය විධිමත්ව පවරාගෙන නොතිබුණි. |
| දිඹුලාගල සංස්කෘතික මධ්‍යස්ථානය | තොරතුරු ඉදිරිපත් නොවුණි. | 1,375,000 | ගොඩනැගිලි හා භූමිය පවරාගෙන නොතිබුණි. |

**(ආ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ප්‍රමාද කිරීම නිසා ඇස්තමේන්තුගත පිරිවැය වැඩිවීම.**

මාදම්පේ ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශයේ සංස්කෘතික මධ්‍යස්ථානයක් ඉදිකිරිම සඳහා 2009 වර්ෂයේදි පිළියෙල කර තිබුණු පිරිවැය ඇස්තමේන්තුව අනුව රු.6,592,435 ක් වි තිබුණත්, වර්ෂ 04 කට පසු 2012 වර්ෂයේදි පිළියෙල කළ රු.15,790,806 ක සංශෝධිත ඇස්තමේන්තුව අනුව ඉදිරිකිරිම් කටයුතු ආරම්භ කර තිබුණි.

**(ඇ) ව්‍යාපෘති ආරම්භ නොකිරීම**

ආදිවාසි ගම්මාන සංරක්ෂණ ව්‍යාපෘතිය සඳහා රු.10,000,000 ක ඇස්තමේන්තුවක් පිළියෙල කර 2014 වර්ෂයේදී ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කිරීම සඳහා ප්‍රතිපාදන සළසා තිබුණි. එම සළසා තිබුණු ප්‍රතිපාදන වෙනත් වැය විෂයයකට මාරු කිරිම නිසා ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි.

(ඇ) **මුදල් නිදහස් කර තිබුණත් ප්‍රමාණවත් ප්‍රගතියක් නොමැති ව්‍යාපෘති**

පහත සඳහන් ව්‍යාපාති සඳහා මුදල් නිදහස් කර තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ප්‍රමාණවත් ප්‍රගතියක් අත්කර ගෙන නොතිබුණි.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තු ගත පිරිවැය | නිදහස් කළ ප්‍රතිපාදනය | වෙනත් කරුණු |
|---|---|---|---|
| | රු. | රු. | |
| වාකරේ ආදිවාසී සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීම | 2,000,000 | 400,000 | මූල්‍ය හෝ භෞතික ප්‍රගතිය වාර්තාගත වී නොතිබුණි. |
| හේනානිගල ආදිවාසී ජන උරුම කේන්ද්‍රය ඉදිකිරීම | 9,863,012 | 1,972,602 | - එම - |

## 3.10 කාර්යසාධනය

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරි සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරික්ෂණ පහත දැක්වේ.

(අ) ඉදිකිරීම් ආරම්භ කරන ලද වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසාන වන විට වසර 16 ක කාලයක් ඉක්මවා තිබුණත්, දිඹුලාගල සංස්කෘතික මධ්‍යස්ථානය විවෘත කර වැඩසටහන් ආරම්භ කිරීමට 2014 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි. මේ සඳහා ගොඩනැගිලි නවීකරණය වෙනුවෙන් රු.1,375,000 ක් වැය කර තිබුණි.

(ආ) මන්නාරම් දිස්ත්‍රික්කයේ පේසාලේ බල ප්‍රදේශයේ සංස්කෘතික මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා ප්‍රාදේශිය ලේකම් විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තු හා ප්‍රමාන පත්‍ර අනුව ඉදිකිරීම් සිදුකර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශ ප්‍රතිපාදන රු.1,887,901 ක් වැයකර තිබු අතර මධ්‍යස්ථානය විවෘත කිරීමට ප්‍රමාණවත් පරිදි පහසුකම් සම්පූර්ණ කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් එම මධ්‍යස්ථානය විවෘත කර නොතිබුණි.

(ඇ) මාදම්පේ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ සංස්කෘතික මධ්‍යස්ථානයක් පිහිටුවීමට සැලැසුම් කර 2009 ජුලි මාසයේදී ශාක්‍යතා වාර්තාව පිළියෙල කර තිබුණු අතර ස්ථානීය පරීක්ෂාව සිදු කර අමාත්‍යාංශය විසින් ව්‍යාපාතිය අනුමත කර තිබුණි. ඒ සඳහා රු.15,709,806 ක පිරිවැය ඇස්තමේන්තුවෙන්, 2014 වර්ෂය අවසාන වන විට රු.7,709,560 ක් වැය කර තිබුණි. කොන්ත්‍රාත්කරුගේ ප්‍රමාදය හා අමාත්‍යාංශය විසින් භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විපරම් නොකිරීම හේතුවෙන් ප්‍රමාණවත් කාර්යසාධනයක් ලබා ගෙන නොතිබුණි.

(ඈ) සමන්තුරේ සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා 2003 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා රු.2,275,000 ක ප්‍රතිපාදන නිදහස් කර තිබුණි. සංස්කෘතික මධ්‍යස්ථානය විවෘත කර වැඩසටහන් පවත්වාගෙන යාමට හැකි වුවද සමාලෝචිත වර්ෂය අවසානය තෙක් මධ්‍යස්ථානය විවෘත කිරීමට කටයුතු කර නොතිබුණි.

**3.11 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

අමාත්‍යාංශය විසින් සිදු කර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වු එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) 2014 ජුනි 10 දින සිට 15 දින දක්වා ප්‍රංශයේ පැරිස් නුවර පැවැත්වු මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර 100 වෙනි ජන්ම ශත සංවත්සරය උළෙලේ වියදම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලබේ.

(i). ඉහත සඳහන් කරුණ සඳහා අමාත්‍යාංශය විසින් ප්‍රංශයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය වෙත රු.3,702,309 (යුරෝ 20,500) ක් යවා තිබුණි. එම මුදලට

අදාල බිල්පත් සහ වියදම් විස්තර සමග ඉතිරි මුදල නැවත අමාත්‍යාංශය වෙත ලබා ගැනීමට 2015 අගෝස්තු 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ii). අමාත්‍යාංශය විසින් රු.10,075,687 ක් වැය කර ප්‍රංශයේ පැරිස් නුවර මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර 100 වෙනි ජන්ම ශත සංවත්සරය උළෙලේදී වටමේස සාකච්ඡාවක් පවත්වා තිබුණි. එහිදී ගනු ලැබූ තීරණයන් හා සාකච්ඡා කළ කරුණුවල ඵලදායීතාවය පිළිබඳ කිසිදු තොරතුරක් අමාත්‍යාංශය විසින් පවත්වා තිබුණු ලිපිගොනු වල වූ තොරතුරුවලින් තහවුරු නොවූ අතර, ඉන් ශ්‍රී ලංකා රජයට හෝ අමාත්‍යාංශය වෙත ලැබුණු ප්‍රතිලාභ පිළිබඳ තොරතුරුද අනාවරණය වී නොතිබුණි. එමෙන්ම මෙම සංචාරය සඳහා සංස්කෘතික අමාත්‍යාංශය හා ඊට අනුබද්ධිත ආයතනවලින් සහභාගී වූ කිසිදු නිලධාරියෙකු සංචාරය සම්බන්ධ වාර්තා කිසිවක් ඉදිරිපත් කර නොතිබුණි.

(iii). මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර 100 වන ජන්ම ශත සංවත්සරය වෙනුවෙන් ප්‍රංශයේ පැරිස් නුවර පැවැත්වූ උළෙලට සහභාගී වීම සඳහා සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශ විෂය පථය යටතේ ඇති ආයතනවල නිලධාරීන් වෙනුවෙන් පමණක් සංචාරය සඳහා වියදම් අමාත්‍යාංශය විසින් වැය කිරීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී තිබුණි. ඊට පටහැනිව එම උළෙලට සහභාගී වූ බාහිර සමාගමක සභාපතිවරයෙකු වෙනුවෙන් ගුවන් ප්‍රවේශ පත්‍ර ගාස්තු, සංයුක්ත දීමනා හා අනියම් දීමනා ලෙස රු.540,316 ක්ද, වෙනත් බාහිර පුද්ගලයින් දෙදෙනෙකුගේ ගුවන් ප්‍රවේශපත් වෙනුවෙන් රු.232,000 ක්ද අමාත්‍යාංශය විසින් වැය කර තිබුණි.

(ආ) තායිලන්තයේ Ayutthaya නගරයේ 2014 මැයි 9 දින සිට 11 දින දක්වා කාල පරිච්ඡේදය තුළ පැවති වෙසක් දින සැමරීමේ උත්සවය සඳහා අමාත්‍යාංශය කාර්ය මණ්ඩලය සමග ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් 07 දෙනෙකු සහ වෙනත් බාහිර පුද්ලයින් 4 දෙනෙකු සහභාගී වී තිබුණි. එම පුද්ගලයන් සඳහා සංචාරය වෙනුවෙන් අමාත්‍යාංශය විසින් රු.452,100 ක් වැයකර තිබුණි. සංචාරය වෙනුවෙන් මෙම පුද්ගලයින්ගේ කාර්යභාරය කුමක්ද යන්න විගණනයට අනාවරණය කර නොතිබුණි.

(ඇ) 2014 අප්‍රේල් 28 දින සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා වෙත මල්වතු මහා විහාරයෙන් පිරිනමා තිබූ ගෞරව සම්මානය ඇගැයීමට ලක් කිරීම සඳහා පෞද්ගලික සංවිධානයක් විසින් 2014 ජුනි 01 දින හා 2014 අගෝස්තු 13 දින පවත්වා තිබුණු උපහාර පිදීමේ උත්සවය සඳහා අමාත්‍යාංශය රු.617,950 ක් වැයකර තිබුණි. මෙම ගෙවීම් මුදල් රෙගුලාසි 128(1)(ඒ) විධිවිධානයන්ට පටහැනිව සිදුකර තිබුණි.

(ඈ) පූර්ව චිත්‍රපටි දර්ශන නැරඹීම වෙනුවෙන් ප්‍රසිද්ධ රූගත් පාලක මණ්ඩලයේ සභාපතිවරයා වෙත දීමනාවක් ගෙවා තිබුණද ඒ සඳහා සහභාගී වූ බව සනාථ කිරීමට

පැමිණීමේ හා පිටවීමේ ලේඛනයේ අත්සන යොදා නොතිබුණි. එසේ පැමිණීම හා පිටවීම තහවුරු කර නොගෙන චිත්‍රපට පූර්ව දර්ශන නැරඹීමට සහභාගීවීම වෙනුවෙන් 2014 වර්ෂයේ රු.156,000 ක් දීමනා සභාපතිවරයා වෙත ගෙවා තිබුණි.

(ඉ) 2014 සැප්තැම්බර් 24 දින සිට 26 දින දක්වා ඉන්දියාවේ පැවති සාර්ක් සංස්කෘතික අමාත්‍යවරුන්ගේ සම්මේලනය සඳහා සහභාගී වූ නර්තන කණ්ඩායමේ කළමනාකරු ලෙස අමාත්‍යාංශ නිලධාරියෙකු හෝ රාජ්‍ය නර්තන අනුමණ්ඩලයේ සාමාජිකයෙකුද නොවන අයෙක් සහභාගී වී තිබුණි. නර්තන ක්ෂේත්‍රයට කිසිදු සම්බන්ධතාවයක් නොමැති මෙම අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරියකද කණ්ඩායමේ කළමනාකරු ලෙස සහභාගී කර තිබුණි.

(ඊ) 2014 අප්‍රේල් 08 දින සිට 11 දින දක්වා බංගලාදේශයේ පැවැත්වූ SARAC Artist Camp & Exhibition of Paintings 2014 සංචාරය සඳහා පිටත්වන කණ්ඩායමේ කළමනාකරු ලෙස චිත්‍ර කලා විෂයයට කිසිදු සම්බන්ධයක් නොමැති නිලධාරිනියක් සහභාගී වී තිබුණි. අදාල විෂයය සම්බන්ධයෙන් දැනුමැති අයෙකු කළමනාකරු ලෙස සහභාගී නොකිරීම හා විෂයයට සම්බන්ධයක් නැති නිලධාරීන් යෙදවීමේ අදාලත්වය විගණනයට තහවුරු නොවුණි.

## 3.12 අවිධිමත් ගනුදෙනු

-------------------

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) **රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පරිපාටියෙන් බැහැර වීම.**

----------------------------------------------------------------------

ශ්‍රී ලංකා කලා මණ්ඩලය පවත්වාගෙන ගිය පැරණි ගොඩනැගිල්ල 2014 දෙසැම්බර් මාසය දක්වා මාසික කුලිය රු.50,000 ක් ලෙසත්, 2015 වර්ෂයේ සිට එහි මාසික කුලිය රු.85,000 ක් ලෙස ලබාදිය හැකි බව එම ගොඩනැගිල්ල හිමිකරු විසින් ප්‍රකාශ කර තිබුණි. ඒ පිළිබඳව නොසළකා පැරණි ගොඩනැගිල්ලේ කුලී කාලය අවසන් වීමෙන් පසු මසකට රු.145,000 කුලියක් යටතේ වෙනත් ගොඩනැගිල්ලක් 2014 දෙසැම්බර් මාසයේ සිට ලබා ගෙන තිබුණි. එම ගොඩනැගිල්ල සඳහා වර්ෂ 03 කට රු.5,220,000 ක බදු කුලී ගිවිසුමකට ඇතුළත්ව තිබූ අතර ප්‍රථම වර්ෂයේ බදු කුලී වශයෙන් රු.1,740,000 ක් 2014 නොවැම්බර් 04 දින ගෙවා තිබුණි. එමෙන්ම නව ගොඩනැගිල්ල ලබා ගැනීමේදී තරඟකාරී මිල කැඳවීමක් සිදුකර නොතිබීම නිසා විනිවිදභාවයෙන් තොරව කටයුතු කර තිබුණි.

(ආ) **අධිකාරි බලය නොමැති වූ ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මාදම්පේ සංස්කෘතික මධ්‍යස්ථානය අදියර I ඉදිකිරීම සඳහා 2013 මැයි 14 දින පිළියෙල කර තිබුණු ඇස්තමේන්තුව අනුව පිරිවැය (construction cost) රු.5,089,033 ක් වී තිබුණි. එම ඇස්තමේන්තු පිරිවැයෙන් සියයට 5 ක අසම්භාව්‍යයන් සඳහා රු.254,452 ක් ඉඩදී තිබුණි. එහෙත් කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කර තිබූ අවසන් ගෙවීම් බිල්පත අනුව අසම්භාව්‍යයන් වෙනුවෙන් බිල් කළ වටිනාකම (Excess work and Extra work) රු.590,275 ක් හෙවත් ඇස්තමේන්තු පිරිවැයෙන් සියයට 11.6 ක් වී තිබුණි. ඒ අනුව ඉඩ දී තිබුණු පිරිවැය රු.335,824 කින් ඉක්මවා කොන්ත්‍රාත්කරු වෙත ගෙවීම් කර තිබුණත්, ඒ සඳහා විධිමත් අනුමැතියක් ලබා ගෙන නොතිබුණි.

(ii) තායිලන්ත වෙසක් සැමරීමේ උත්සවය සඳහා 2014 මැයි 7 දින සිට 13 දින දක්වා කාල පරිච්ඡේදය තුළ සහභාගී වන ඇමතිවරයා ඇතුළු 33 දෙනෙකු වෙත ජනාධිපතිවරයාගේ අනුමැතිය 2014 මැයි 19 දින ලබාදී තිබුණි. නමුත් සංචාරය සඳහා 36 දෙනෙකු සහභාගී වී තිබුණි. ඒ අනුව ජනාධිපතිවරයාගේ අනුමැතියකින් තොරව 4 දෙනෙකු ඒ සඳහා සහභාගී වී තිබුණි.

(iii) ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය වෙතින් DVD හා VCD පට සඳහා සහතික ලබා ගැනීමට අයදුම්කරන්නන්ගෙන් රු.1,000 ක ගාස්තුවක් අයකිරීම අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය මත සිදු කර තිබුණි. ඒ සඳහා පාර්ලිමේන්තුවේ පනතකින් හෝ වෙනයම් විධිමත් අධිකාරි බලයකින් අනුමැතියක් ලැබී නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ ජනවාරි මාසයේ සිට ඔක්තෝබර් මාසය දක්වා කාලපරිච්ඡේදය තුළ DVD පට 188 ක් සඳහා අයදුම්කරුවන්ගෙන් රු. 188,000 ක ගාස්තු අයකර තිබුණි.

**3.13 පාඩු හා හානි**

මාදම්පේ සංස්කෘතික මධ්‍යස්ථානයේ I අදියර ඉදිකිරීමට කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කළ රු.5,380,780 ක ලංසු වටිනාකමෙන් සියයට 8 ක වට්ටමක් අඩුකර ඉදිකිරීම් නිම කිරීමට එකඟව කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. ඒ අනුව අවසාන ගෙවීම් බිල්පත්‍රයේ රු.5,097,821 ක සහතික කළ වැඩ වටිනාකමෙන් සියයට 8 ක් අඩු කර කොන්ත්‍රාත්කරු වෙත ගෙවීම් කළ යුතු වුවද, එම බිල්පත්‍රයේ සම්පූර්ණ මුදලම ගෙවීම නිසා අමාත්‍යාංශය විසින් රු.407,826 ක් වැඩිපුර ගෙවා තිබුණි.

**3.14 අනාර්ථික ගනුදෙනු**

දිඹුලාගල සංස්කෘතික මධ්‍යස්ථානයේ ඉදිකිරීම් වෙනුවෙන් රු.1,375,000 ක් වැය කර තිබුණත්, එම ඉදිකිරීම් ආරම්භ කරන ලද වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසාන වන විට වසර 16 ක් ඉක්මවා තිබුණත්, එම ඉදිකිරීම කළ මහවැලි අධිකාරියට අයත් අරලගංවිල ඉඩම හා ගොඩනැගිල්ල සංස්කෘතික අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.15 විසඳා නොතිබූ විගණන ඡේද**

අමාත්‍යාංශයට අදාලව පසුගිය වර්ෂවලට අදාළ විගණකාධිපති වාර්තාලවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| | විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|---|
| | වර්ෂය | ඡේද අංකය | |
| (i) | 2012<br>2013 | 4.5<br>5.5 | **මධ්‍යම සංස්කෘතික අරමුදල -**<br>පොළොන්නරුව පූජා භූමියේ ඇතුළුවීමේ දොරටුවේ සිට අභ්‍යන්තර ප්‍රවේශ මාර්ගය කි.මී. 1 ක් දුරට සිමෙන්ති බ්ලොක් ගල් අතුරා වැඩි දියුණු කිරීමේ කාර්යය කොන්ත්‍රාත් සමාගමක් වෙත පවරා තිබුණි. මෙහිදී නිසි ප්‍රමිතියට නොමැති ඉදිකිරීම් වෙනුවෙන් රු.22,099,917 ක්ද, ඉටු නොකළ වැඩ වෙනුවෙන් රු.4,660,998 ක්ද ගෙවා තිබුණි. නිසි ප්‍රමිතියට ඉදිකිරීම් සිදු නොකිරීම සම්බන්ධව කොන්ත්‍රාත්කරුට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ii) | 2013 | 4.4 (අ) | විදේශීය සංචාර ප්‍රවේශපත් සමග නොමිලේ ලබාදීම සඳහා සීගිරිය, පොළොන්නරුව හා අනුරාධපුරය යන සිද්ධස්ථාන ඇතුළත් DVD ලක්ෂ 5ක් නිෂ්පාදනය කර ගැනීම සඳහා චිත්‍රපට අධ්‍යක්ෂවරයකු වෙත රු.51,099,925 ක් ගෙවා තිබුණි. මෙම කොන්ත්‍රාත්කරු විසින් පෙර නිෂ්පාදනය කර භාරදී තිබූ වාර්තාමය චිත්‍රපටවල දර්ශන පරිගණක පිටපත් කිරීමක් තුළින් යළි සකසා නව නිර්මාණයක් ලෙසින් වංචා සහගතව ලබාදී තිබුණි. එමෙන්ම ඔහු වෙත මෙම විෂයය කරුණු |

සම්බන්ධව මීට පෙර ලබාදුන් රු.4,701,000 ක කොන්ත්‍රාත්තුවක් කඩකර තිබීම පිළිබඳ අවධානය යොමු කර නොතිබුණි. ඉදිරිපත් වූ අවම ලංසුව නොසළකා හැර උපරිම ලංසුව තෝරා ගැනීම හේතුවෙන් රු.18,125,000 ක අලාභයක් සිදු වී තිබුණු අතර ලංසු සුරක්ෂණ හා කාර්යසාධන සුරක්ෂණවල වටිනාකමෙන් රු.2,727,500 ක් අඩුවෙන් කොන්ත්‍රාත්කරු වෙතින් ලබාගෙන තිබුණි.

| | | | |
|---|---|---|---|
| (iii) | 2013 | 4.4 (ආ) | වයඹ සංස්කෘතික චතුරස්‍රයේ වැඩබිම්වල සේවය සඳහා පුහුණු සංරක්ෂණ /කැණීම් සහයකින් කොන්ත්‍රාත් පදනම මත සීමාසහිත සංස්කෘතික සංරක්ෂණ හා ඉදිකිරීම් සමාගමෙන් ලබා ගැනිම සඳහා 2013 වර්ෂය වෙනුවෙන් රු.114,879,000 ක් ගෙවා තිබුණි. අමාත්‍ය මණ්ඩලයේ තීරණය පරිදි සමාගම විසින් අරමුදලේ සේවකයින් යොදාගෙන අරමුදලේ ඉදිකිරීම් හා සංරක්ෂණ කටයුතු ඉටු කර එම සේවකයින්ට සමාගම විසින් වැටුප් ගෙවීම සිදු කළ යුතු විය. ඒ වෙනුවට සමාගමේ සේවකයින් සඳහා අරමුදලින් වැටුප් ගෙවීමට එකඟ වෙමින් ගිවිසුම්වලට එළඹ තිබුණි.<br><br>ගිවිසුම අනුව ශ්‍රමික මිනිස් දිනයක් වෙනුවෙන් අරමුදල විසින් රු.1,200 ක් සමාගමට ගෙවා තිබුණු අතර සමාගම විසින් ශ්‍රමිකයන්ට රු.700 ක් ගෙවා තිබුණි. මේ අනුව 2013 වර්ෂයේදි ලබාගත් මිනිස් දින 95,732 ක් වෙනුවෙන් රු.47,866,000 ක ලාභයක් ඉපැයිමට සමාගමට ඉඩ සැලැසී තිබුණු අතර, අමාත්‍ය මණ්ඩලයේ තීරණයට පටහැනිව කටයුතු කරන සමාගම සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |

## 3.16 කළමනාකරණ දුර්වලතා

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) 2014 දෙසැම්බර් 31 දින වන විට අමාත්‍යාංශය විසින් ප්‍රාදේශීය සංස්කෘතික මධ්‍යස්ථාන 170 ක් පිහිටුවා තිබුණු අතර ඒ සඳහා අනුයුක්ත කාර්ය මණ්ඩලය 889 ක් විය. ප්‍රාදේශීය සංස්කෘතික මධ්‍යස්ථානවල කාර්ය මණ්ඩලයේ පැමිණීම, බැහැර යාම,

නිවාඩු හා ඒ පිළිබඳ ලිපි ලේඛන පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් පවතින අභ්‍යන්තර පාලන ක්‍රමය දුර්වල බව හා ඒ සඳහා විධිමත් පාලන ක්‍රමයක් ස්ථාපිත කළ යුතු බවත් නිරීක්ෂණය විය.

**3.17 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 15 | 13 | 02 | - |
| (ii) | තෘතියික මට්ටම | 04 | 02 | 02 | - |
| (iii) | ද්විතියික මට්ටම | 579 | 515 | 64 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 409 | 403 | 06 | - |
| (vi) | ආදේශක | - | 183 | - | 183 |
| | **එකතුව** | **1,007** | **1,116** | **74** | **183** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 74 ක් පිරවීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

**4. ශීර්ෂ 206 - සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව**

**4.1 ගිණුම් ඉදිරිපත් කිරීම**

දෙපාර්තමේන්තුව විසින් 2015 මාර්තු 31 දින වන විට විෂය අංක 20601 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත්, එම සැසඳුම් ප්‍රකාශය මාස 01 දින 21 ක ප්‍රමාදයකින් පසුව 2015 මැයි 21 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

**4.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|---|
| (i) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |
| (ii) | පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි |
| (iii) | දෙපාර්තමේන්තු විසර්ජන (සම්මත වැය) ලෙජරය | මුදල් රෙගුලාසි 447 | විධිමත්ව පවත්වා ගෙන නොතිබුණි |
| (iv) | මුදල් ඇණවුම් ලේඛනය | මුදල් රෙගුලාසි 451 | විධිමත් පරිදි පවත්වා නොතිබුණි. |
| (v) | රාජකාරි දුරකථන ලේඛනය | මුදල් රෙගුලාසි 845(1) | විධිමත් පරිදි පවත්වා නොතිබුණි. |
| (vi) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) | පවත්වා නොතිබුණි. |
| (vii) | පොදු තැන්පත් ලෙජරය | මුදල් රෙගුලාසි 565 හා 569 | විධිමත් පරිදි පවත්වා නොතිබුණි. |

**4.3 විගණන සාක්ෂි නොවීම**

**---------------------------**

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 වර්ෂයේදී විශ්වකෝෂ කාර්යාලය පවත්වාගෙන යාම සඳහා ගොඩනැගිල්ලක් රු.260,000 ක් බැගින් මාසික කුලී පදනම මත ලබා ගැනීමේදී පුවත්පත්වල දැන්වීම් පළ කර මිල ගණන් කැඳවා තිබුණද, ඊට අදාල ප්‍රසම්පාදන ලියවිලි, ලැබුණු ලංසු, ප්‍රසම්පාදන තීරණ හා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරිම ආදී විස්තර පිළිබඳව ප්‍රමාණවත් තොරතුරු, විගණනයට ඉදිරිපත් කළ ලිපිගොනුවල නොතිබුණි. ඒ අනුව එම ගනුදෙනුවේ විනිවිද භාවය තහවුරු නොවුණි.

(ආ) දෙපාර්තමේන්තු සංචිතයේ පැවති මෝටර් රථයක් 2013 වර්ෂයේ සිට 2015 මැයි මාසය දක්වා කාලය තුළ ඉන්ධන ලීටර් 8574 ක් වැය කරමින් කි.මී. 77,211 ක් දුර ධාවනය කර තිබුණි. එම වාහනය යොදවන ලද රාජකාරිය හා එය පරිහරණය කරන ලද්දේ කවුරුන්ද යන්න තහවුරු කරගත හැකි සාක්ෂි කිසිවක් විගණනයට ඉදිරිපත් නොවුණි. එම කාලය තුළ වාහනය භාවිතා කළ නිලධාරියා කවුද යන්න ධාවන සටහන්පත්වල ලියා නොතිබු අතර ඔහුගේ අත්සනද යොදා නොතිබුණි.

**4.4 විගණන විමසුම්වලට පිළිතුරු දීම.**

**-----------------------------------------**

දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 3 කට 2015 ජුලි 15 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාල ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.37,472,148 ක් විය.

**4.5 විසර්ජන ගිණුම**

**------------------**

**4.5.1 අයවැය විචලනය**

**--------------------**

වැය විෂයයන් 8 ක් සඳහා සළසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් උපයෝජනයන් කළ පසු ඉතිරිය ඉක්මවා රු.10,836,906 ක බැරකම්වලට එළඹ තිබුණි. එමෙන්ම වැය විෂයයන් 18 ක් සඳහා සළසා තිබුණු ප්‍රතිපාදන 2014 දෙසැම්බර් 31 දින වන විට උපයෝජනය කර අවසන්ව තිබියදී සමාලෝචිත වර්ෂය වෙනුවෙන් තව දුරටත් රු5,785,085 ක බැරකම්වලට එළඹ තිබුණි.

**4.6 අග්‍රිම ගිණුම්**

**-------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 371 හි සඳහන් විධිවිධානයන්ට පටහැනි ලෙස මාණ්ඩලික නොවන නිලධාරීන් 28 ක් වෙත අවස්ථා 705 කදී එකතුව රු.14,278,280 ක තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව අදාල කාර්ය නිමකළ වහාම ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළ යුතු වුවත්, සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ විසින් අවස්ථා 59 කදී ලබාගෙන තිබු සම්පූර්ණ වටිනාකම රු.2,267,700 ක්වු තත්කාර්ය අතුරු අග්‍රිම පියවීම මාස 1 ක සිට මාස 8 ක් දක්වා කාලයක් ප්‍රමාද කර තිබුණි. තවද මාණ්ඩලික නොවන නිලධාරීන් 40 වෙත අවස්ථා 247 කදී ලබාදී තිබු රු.4,297,085 ක්වු තත්කාර්ය අතුරු අග්‍රිම පියවීම මාස 2 ක සිට මාස 12 ක් දක්වා කාල පරාසයක් ප්‍රමාද කර තිබුණි.

(ඇ) 2011 අගෝස්තු 23 දිනැති අංක TO/TM/HRD/02/50 දරන භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියෙහි අනුමැතියට පටහැනිව අවස්ථා 8 කදී නිලධාරීන් 8 දෙනෙකු වෙත එකතුව රු. 568,250 ක් වු අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

(ඈ) මුදල් රෙගුලාසි 371(2) හි සඳහන් විධිවිධානවලට පටහැනිව කලින් ලබාගත් අතුරු අග්‍රිම පියවීමට පෙර නැවත නැවතත් අතුරු අග්‍රිම ලබාදී තිබුණි. ඒ අනුව සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ විසින් 2014 මාර්තු 05 දින අත්තිකාරම් ලබා ගැනීමේදී ඊට පෙර අවස්ථා 16 කදී ලබාගත් රු.458,900 ක්ද, 2014 අප්‍රේල් 24 දින අත්තිකාරම් ලබා ගැනීමේදී පෙර අවස්ථා 37 කදී ලබාගත් රු.1,471,950 ක්ද හා 2014 සැප්තැම්බර් 23 දින අත්තිකාරම් ලබා ගැනීමේදී පෙර අවස්ථා 19 කදී ලබාගත් රු.706,550 ක්ද වශයෙන් වු අතුරු අග්‍රිම පියවා නොතිබුණි. එමෙන්ම මාණ්ඩලික නොවන නිලධාරීන් 3 න් දෙනෙක් විසින් අවස්ථා 86 කදී ලබාගත් රු.1,443,250 ක තත්කාර්ය අතුරු අග්‍රිම පියවීමට පෙර නැවත තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදී තිබුණි.

(ඉ) මුදල් රෙගුලාසි 371(2) ප්‍රකාරව ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමවලින් වැය නොවු ඉතිරි මුදල පියවීම වහාම සිදු කළ යුතු වුවත්, නිලධාරීන් 3 න් දෙනෙක් විසින් අවස්ථා 3 කදී ලබාගෙන තිබු රු.55,000 ක අත්තිකාරම් වැය නොකර නැවත මුදලින් පියවීමට දින 10, දින 20 හා දින 79 වශයෙන් ප්‍රමාදවී තිබුණි. තවද නිලධාරීන් 9 දෙනෙකු වෙත අවස්ථා 11 කදී ලබාදී තිබු රු.457,325 ක අත්තිකාරම් අදාල කාර්යයට යොදා ඉතිරිය වු රු.70,801 ක් මුදලින් පියවීමට දින 10 සිට දින 207 දක්වා කාල පරාසයක ප්‍රමාදයක් සිදු කර තිබුණි.

**4.7 පොදු තැන්පතු ගිණුම්**

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 2 ඉක්මවූ මුළු වටිනාකම රු. 6,479,505 ක්වූ තැන්පතු 196 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා කලාකරුවන් සඳහා වන ජාතික භාරය සඳහා අරමුදල් ලැබීම් වශයෙන් මහා භාරකාර දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කළ යුතු රු.670,924 ක කොඩි අලෙවි ආදායම් එම දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය නොකර පොදු තැන්පත් ගිණුමේ විවිධ තැන්පතු යටතේ දක්වා තිබුණි.

(ඇ) 2014 දෙසැම්බර් 31 දින පොදු තැන්පතු ගිණුමේ පැවති කොන්ත්‍රාත්කරුවන්ගෙන් රඳවා ගැනීම්වල එකතුව රු.6,087,930 ක් වර්ෂ 01 ක කාලයක් ඉක්මවා තිබුණි. මෙම රඳවා ගැනීම සම්බන්ධයෙන් ඉදිකිරීම් කොන්ත්‍රාත් ගිවිසුම අනුව කටයුතු කර නොතිබුණි.

**4.8 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

-------------------------------------------

විෂය අංක 20601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාර එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.1,071,525 වූ අතර, එම ශේෂ අතරින් ස්ථානමාරු වී ගිය නිලධාරීන්ගෙන් රු.90,568 ක් වර්ෂ 3 කට වැඩි කාලයක සිටද, විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් රු.155,700 ක් වර්ෂයකට වැඩි කාලයක සිටද, වැඩ තහනම් නිලධාරීන්ගෙන් රු.178,780 ක් වර්ෂ 02 කට වැඩි කාලයක සිටද, සේවය අතහැර ගිය නිලධාරීන්ගෙන් රු.94,523 ක් වර්ෂ 5 කට වැඩි කාලයක සිටද හිඟහිටව පැවතුණි. එම ණය ශේෂ 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ විධිවිධාන පරිදි කටයුතු කර අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් පාලන ගිණුම අනුව වර්ෂය අවසාන හර ශේෂය හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව වර්ෂය අවසාන හර ශේෂය අතර රු.444,761 ක වෙනසක් පැවතුණි. ඒ සම්බන්ධව 1994 අගෝස්තු 18 දිනැති අංක 96 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2 ඡේදය ප්‍රකාර සැසඳුම් ප්‍රකාශයේ හේතු පැහැදිලි කර නොතිබුණි.

(ඇ) 2014 දෙසැම්බර් 31 දින පිළියෙල කර තිබූ කෝවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව හා දෙපාර්තමේන්තු ණය අත්තිකාරම් පාලන ගිණුමේ වර්ෂ අවසාන හර ශේෂය අතර රු.156,951 ක වෙනසක් පැවතුණි. එම නොසැසඳීම සම්බන්ධ රු.7,906 ක වටිනාකම සඳහා පමණක් හේතු පැහැදිලි කර තිබුණද එම වටිනාකම ගැලපූ පසුව තවදුරටත් වෙනස රු.164,857 ක් විය.

(ඇ) 2014 දෙසැම්බර් 31 දින රජයේ නිලධාරීන්ට අත්තිකාරම් සැසඳුම් ප්‍රකාශය සමග ඉදිරිපත් කර තිබූ කෝවල ශේෂ ලැයිස්තු හා උපලේඛන, 1994 අගෝස්තු 18 දිනැති අංක 96 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5 ජේදයේ දක්වා ඇති පරිදි විස්තර ඇතුලත්ව ලේඛන පිළියෙල කර නොතිබුණි.

## 4.9 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### අභ්‍යන්තර විගණනය

දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය තුළ අභ්‍යන්තර විගණක තනතුරක් තිබුණද, එය පුරප්පාඩු වී පැවතුණි. සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන හා විමර්ශන ඒකකය මගින් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන හා විමර්ශන කාර්යයන් ඉටු කිරිම සඳහා 2014 වර්ෂය වෙනුවෙන් මිනිස් පැය 900 ක් වෙන්කර තිබූ නමුත් දෙපාර්තමේන්තුවේ කිසිදු විමර්ශනයක් හෝ අභ්‍යන්තර විගණනයක් එම ඒකකය විසින් සිදු කර නොතිබුණි.

## 4.10 වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

### (අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

2014 ඔක්තෝම්බර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර 2015 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය හා හඳුනාගත් පරිශ්‍රයන් 9 ක එම වාර්තා 2015 ජුලි 31 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. එමෙන්ම 2013 වර්ෂයට අදාල වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතුද 2015 ජුනි 30 දින වන විටත් නිම කර නොතිබුණි.

(ආ) **පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර නාට්‍ය පුහුණු හා පර්යේෂණ ආයතනය ඉදිකිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් රාජගිරිය කලපලුවාව ප්‍රදේශයේ අතහැර තිබූ පාසල් භූමියක් හා එහි ගොඩනැගිලි තෝරාගෙන තිබුණි. මෙම භූමියේ අයිතිය විධිමත්ව පවරා නොගෙන 2015 මාර්තු 31 දින වන විට ඉදිකිරීම් කටයුතු සඳහා රු.11,312,248 ක් වැයකර තිබූ අතර තවත් රු.3,147,007 ක් ඉදිරියේදී ගෙවීමට බැඳී තිබුණි.

(ඇ) **බේරුම් නොකළ බැරකම්**

දෙපාර්තමේන්තුව මගින් 2014 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම්වල වටිනාකම රු.36,429,076 ක් වූ අතර එම බැරකම් වර්ෂ 01 ට අඩු කාලයක සිට පැවැත එන ශේෂ විය.

## 4.11 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | | **වටිනාකම** | **අනුකූල නොවීම** |
|---|---|---|---|
| | | රු. | |
| **(අ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) | මුදල් රෙගුලාසි 396 | 451,219 | 2014 දෙසැම්බර් 31 දින වන විට නිකුත් කළ නමුත් මාස 06 කට වැඩි කල් ඉකුත් වූ එකතුව රු.451,219 ක් වූ චෙක්පත් 97 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 835 (1) | 3,120,000 | විශ්වකෝෂ කාර්යාලය පවත්වා ගෙනයාම සඳහා මාසිකව රු.260,000 ක බදු කුලී පදනම මත ගොඩනැගිල්ලක් ලබා ගැනීමේදී |

| | | | |
|---|---|---|---|
| | | | අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 128(1)(ඇ) හා 156 (7), (8) | 16,867,402 | දෙපාර්තමේන්තුවේ නිලධාරීන් වෙත තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීමේදී හා එමගින් වියදම් දැරීමේදී පාලනයකින් හා සීමාවකින් තොරව කටයුතු කර තිබුණි. |
| (iv) | මුදල් රෙගුලාසි 341 (1) | - | දෙපාර්තමේන්තුවේ වාහන ඉන්ධන ඇනවුම් අනුක්‍රමික අංක පිළිවෙලට සටහන් කිරීම සඳහා උප පත්‍රිකා පොත් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

(ආ) **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

| | | | |
|---|---|---|---|
| (i) | 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන චක්‍රලේඛය | | චක්‍රලේඛ විධිවිධාන මගින් අනියම් පත්වීම් කිසිවක් සිදු නොකළ යුතු බවට උපදෙස් දී තිබියදී, 2014 නොවැම්බර් 16 දින සිට අනියම් රියදුරු පත්වීමක් ලබා දී තිබුණි. |
| (ii) | 1980 අප්‍රේල් 01 දිනැති අංක 162 දරන චක්‍රලේඛය | 154,030 | සේවකයකු සේවයට පැමිණීම හා පිටවීම තහවුරු කර නොගෙන වැටුප් හෝ දීමනා ගෙවිය නොහැකි නමුත් 2014 නොවැම්බර් 16 දින සිට අනියම් රියදුරු තනතුරට පත්කර තිබූ ඉහත සේවකයා ඇඟිලි සලකුණු යන්ත්‍රයේ හෝ පැමිණීමේ ලේඛනයක තම පැමිණීම හා පිටවීම සටහන් කර නොතිබියදී 2014 දෙසැම්බර් සිට 2015 අප්‍රේල් දක්වා දීමනා ගෙවා තිබුණි. |
| (iii) | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 චක්‍රලේඛය | | රජයේ සෑම වාහනයක්ම මාස 06 කට වරක් ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂා කළ යුතු වුවද, සංස්කෘතික |

| | | | | |
|---|---|---|---|---|
| | | | | කටයුතු දෙපාර්තමේන්තුවේ වාහන සම්බන්ධව එම පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. |
| | (iv) | 1994 අගෝස්තු 03 දිනැති අංක 26/92 (1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 1992 අගෝස්තු 19 දිනැති අංක 26/92 දරන චක්‍රලේඛය | - | රජයට අයත් සංචිත වාහනවල රාජ්‍ය ලාංඡනය හා ආයතනයේ නම යෙදිය යුතු වුවද, දෙපාර්තමේන්තුව සතු සංචිත වාහන 18 ක් සම්බන්ධයෙන් එම විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | **රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය**<br>---------------------------------- | | | |
| | (i) | මාර්ගෝපදේශ 3.2, 4.3 හා 4.3.2 | 9,671,529 | 2013 හා 2014 වර්ෂයන්හි රූපවාහිනි රාජ්‍ය සම්මාන උළෙල සඳහා අනුග්‍රහයකයන් තෝරා ගැනීමේදී ජාතික තරඟකාරී ලංසු කැඳවීමෙන් තොරව සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂවරයාගේ අවශ්‍යතාවය පරිදි බාහිර පුද්ගලික ආයතන 2 කට එම කාර්යය පවරා තිබුණි.<br>එමෙන්ම එම උළෙල පැවැත්වීම සඳහා දෙපාර්තමේන්තුව විසින් සියලු වියදම් ඇතුළත්ව මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණි. |
| | (ii) | මාර්ගෝපදේශ 3.4.3(ආ) | 669,900 | 2014 නොවැම්බර් මාසයේ පැවති කලාකරු සුහද හමුවක් සඳහා ආරාධනා පත්‍ර 3500 ක් මුද්‍රණය කිරීම හා "කලා කෙතේ රන් අස්වනු"නමින් ග්‍රන්ථයක පිටපත් 3000 ක් මුද්‍රණය කිරීම සඳහා |

වෙළඳපොල මිල සැදහුම් ක්‍රමය යටතේ මිල ගණන් ලබාගෙන තිබූ අතර එම මිළ ගණන් ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කර එම කමිටුවේ තීරණය ලබාගෙන නොතිබුණි. මේ අනුව සැපයුම්කරුවන් තෝරාගත් පදනම විගණනයට තහවුරු නොවුණි.

**4.12 දේශීය මූල්‍යකරණය මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

---

ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම හා ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන් සම්බන්ධව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වු කරුණු පහත දැක්වේ.

**(අ) ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්**

---

2013 වර්ෂයේදි ආරම්භ කළ යුතුව තිබුණු ජාතික කලාභවන ශාලාව නවීකරණය කිරිමේ ව්‍යාපෘතිය සඳහා රු.170,000,000 ක පිරිවැය ඇස්තමේන්තුවක් මත සමාලෝචිත වර්ෂයේදී ආරම්භ කර තිබුණි. ඒ සඳහා 2014 දෙසැම්බර් 31 දින වන විට රු.3,054,840 ක් වැය කර තිබුණි. කලාකරුවන් ඇතුළු විවිධ පාර්ශවයන්ගේ විරෝධතා පැන නැඟීම සාකච්ඡා කිරිම මගින් එකඟතාවන්ට පැමිණ ව්‍යාපෘතිය ඉදිරියට කර ගෙන යාමට තීරණය කර තිබුණත්, 2015 ජුලි 31 දින වන විටත් එම ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර නොතිබුණි.

**(ආ) ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

---

ජෝන් ද සිල්වා සමරු රඟහල ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය 2012 වර්ෂයේදී ආරම්භකර තිබුණු අතර එහි ඇස්තමේන්තුගත පිරිවැය රු.150,000,000 ක් විය. 2014 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය නිම කළ යුතුව තිබුණත්, 2014 දෙසැම්බර් 31 දින වන විට රු.96,110,000 ක් වැය කර තිබුණි. නමුත් ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාදවීම හා කලාකරුවන්ගේ විරෝධතාවය හේතුවෙන් මෙම ව්‍යාපාතිය 2014 දෙසැම්බර් 31 දින වන විටත් නිම කිරිමට නොහැකි වී තිබුණි.

**4.13 කාර්යසාධනය**

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) සැලසුම් කිරීම**

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව පහත සඳහන් අවස්ථාවලදී ක්‍රියා කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(i) දෙපාර්තමේන්තුවේ 2014 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර නාට්‍ය පුහුණු පර්යේෂණ ආයතනය ඉදිකිරීමේ කාර්යය ඇතුළත්ව නොතිබුණද ඒ සඳහා 2015 මාර්තු 20 දින වන විට රු.11,312,248 ක් වැය කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.3,147,007 ක් බැරකම් වශයෙන් ගෙවිය යුතුව තිබුණි.

(ii) ක්‍රියාකාරී සැලැස්මෙන් බැහැරව 2014 නොවැම්බර් 11 දින පැවති කලාකරු සුහද හමුවේදී කලාකරුවන් වෙත බෙදාදීම සඳහා "කලා කෙතේ රන් අස්වනු" නමින් ග්‍රන්ථයක් රු.669,900 ක් වැය කර මුද්‍රණය කර තිබුණි.

දෙපාර්තමේන්තුව විසින් 2013 වර්ෂයේ රූපවාහිනී රාජ්‍ය සම්මාන උළෙල පැවැත්වීම සඳහා රු.3,064,083 ක්ද, 2014 වර්ෂයේ එම උළෙල පැවැත්වීම සඳහා රු.6,607,437 ක්ද වැය කර තිබුණි. මෙම උළෙලේදී රූපවාහිනී කලා නිර්මාණ ඇගැයීමට ලක් කිරීම සිදු කර තිබුණද මෙම විෂයය ජන මාධ්‍ය අමාත්‍යාංශයේ විෂයපථයට අයත් කාර්යයක් බව නිරීක්ෂණය විය. සංස්කෘතික දෙපාර්තමේන්තුව පිහිටුවා වසර 59 ක් ගතවී තිබීම මෙන්ම එහි විෂය පථයට අයත් ඇතැම් අරමුණු හා කාර්යයන් වෙනත් රාජ්‍ය ආයතනවල ප්‍රධාන අරමුණු හා කාර්යයන්වලට අනුගතවී තිබීම හේතුවෙන් දෙපාර්තමේන්තුව විසින් එහි විෂය පථය මෙන්ම අරමුණු හා කාර්යයන් වර්තමානයට ගැලපෙන පරිදි සංශෝධනය කර ගැනීමට කටයුතු කළ යුතු වුවත් එසේ කර නොතිබුණි.

**4.14 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

දෙපාර්තමේන්තුව විසින් සිදු කර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවලදී අනාවරණය වු එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) 2013 හා 2014 වර්ෂ වෙනුවෙන් පැවති රූපවාහිනී රාජ්‍ය සම්මාන උළෙලේ අනුග්‍රාහක ආයතන සමග සංස්කෘතික දෙපාර්තමේන්තුව එළඹී තිබු ගිවිසුම් අනුව, අනුග්‍රාහක ආයතන විසින් දැරිය යුතු වියදම් එකී අනුග්‍රාහක ආයතන විසින් ගෙවීම්

පැහැර හැරීම හේතුවෙන් දෙපාර්තමේන්තු ප්‍රතිපාදන මගින් ගෙවීමට කටයුතු කර තිබුණි. 2013 හා 2014 වර්ෂ සඳහා පිළිවෙලින් රු. 2,219,083 හා රු.2,020,171 ක් මෙසේ දෙපාර්තමේන්තුව විසින් ගෙවා තිබු අතර අදාල අනුග්‍රාහක ආයතන විසින් 2013 හා 2014 වර්ෂවල ගෙවීම් පැහැර හැර 2015 මැයි 31 දිනට පිළිවෙලින් මාස 17 ක් හා මාස 07 ක් ඉකුත්ව තිබුණද දෙපාර්තමේන්තුව විසින් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර අදාල අනුග්‍රහක ගාස්තු ලබා ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව සතු වාහනයක ගමන් කළ නිලධාරියා පිළිබඳ විස්තර හා ගමන හා දුර ප්‍රමාණය ඇතුළත් නොවන සටහනක් පවත්වා තිබුණු අතර, එහි වාහනයේ ගමන් කළ නිලධාරියා අත්සන් නොකර ඒ වෙනුවට වාහන භාර නිලධාරියා එහි අත්සන් කර තිබුණි. විෂය ලිපිකරු විසින් සකසන ලද එම සටහන් පරිපාලන නිලධාරී විසින් පරික්ෂාවකින් තොරව නිර්දේශ කර තිබුණි. මේ නිසා දෙපාර්තමේන්තුව සතු වාහනවල ධාවනය යෙදීම හා ඉන්ධන පිළිබඳ පාලනය දුර්වල තත්ත්වයක පැවැතුණි.

## 4.15 අවිධිමත් ගනුදෙනු

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

### (අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම

මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර නාට්‍ය පුහුණු හා පර්යේෂණ ආයතනය ඉදිකිරීම සඳහා 2015 මාර්තු 20 වන විට රු.11,312,248 ක් වැය කර තිබු අතර ඉදිරියේදී ගෙවීමට රු.3,147,007 ක වැය බැඳීම් ඇතිකරගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). මෙම ඉදිකිරීම් හා ඒ හා සම්බන්ධ ප්‍රසම්පාදනයන් සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වශයෙන් සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. තවද මෙම ව්‍යාපෘතිය පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නිර්දේශ ලබාගෙන නොතිබුණි.

(ii). රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ඉහත සඳහන් කාර්යයන් කරගකාරී ලංසු කැඳවීම තුළින් විවෘත තරඟයට ඉදිරිපත් කළ යුතු වුවද, එසේ කර නොතිබුණි. තවද සංස්කෘතික දෙපාර්තමේන්තුව සතුව ප්‍රමාණවත් සේවකයින් හා උපකරණ පහසුකම් නොතිබියදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.7

මාර්ගෝපදේශයට පටහැනිව කටයුතු කරමින් සෘජු ශ්‍රමය හා සෘජු ද්‍රව්‍ය මිලට ගැනීම් පදනම් යටතේ ඉහත ඉදිකිරීම සිදුකර තිබුණි.

(iii). රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන අවශ්‍යතාව තීරණය කිරීමේ යම් පදනමක් තිබිය යුතු වුවද, මෙම නාට්‍ය පුහුණු ආයතනය පවත්වායාමේ පදනම, බඳවා ගැනීමේ ක්‍රමය, මූල්‍ය කටයුතු පරිපාලනය පිළිබඳ ස්ථාපනය වීම, ආයතනමය පරිපාලනය වැනි මූලික අවශ්‍යතා සඳහා ක්‍රමවේද සකසා ගැනීමෙන් තොරව ඉදිකිරීම් සඳහා වියදම් කර තිබුණි.

(iv). රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 4.2 මාර්ගෝපදේශය ප්‍රකාරව මේ සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් හෝ ප්‍රසම්පාදන කාල සටහනක් නොතිබුණි. තවද ඉදිකිරීම් සඳහා වූ සියලු ආශ්‍රිත වියදම් ඇතුළත් මුළු පිරිවැය ඇස්තමේන්තුවක් දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කර නොතිබූ අතර විධිමත්ව සැකසූ සැලැසුම් හා ප්‍රමාන පත්‍ර නොතිබුණි. එමෙන්ම මුදල් රෙගුලාසි 237 (අ) පරිදි කළ වැඩ වාර්තා සහ ගෙවීම් බිල්පත් සුදුසුකම් ලත් තාක්ෂණික නිලධාරියකු විසින් නිර්දේශ කර නොතිබූ අතර ඉදිකිරීම් සුදුසුකම් ලත් තාක්ෂණික නිලධාරියෙකුගේ අධීක්ෂණයට ලක්වී නොතිබුණි.

(v). මෙම ඉදිකිරීමට අදාල රු.2,841,670 ක් වටිනාකම වූ ප්‍රසම්පාදන කාර්යයන් 4 ක් සඳහා ලබාගෙන තිබූ ලංසු ලේඛන අවිධිමත් හා ව්‍යාජ මෙන්ම රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලින් බැහැරව ලබාගත් ඒවා බව නිරීක්ෂණය විය.

(ආ) **අධිකාරි බලය නොමැති වූ ගනුදෙනු**

**---------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). 2013 හා 2014 වර්ෂවල රූපවාහිනී රාජ්‍ය සම්මාන උළෙල පැවැත්වීම සඳහා පිළිවෙලින් රු.3,064,083 සහ රු.6,607,437ක් වැයකර තිබුණද ඒ සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තු මඟින් ප්‍රතිපාදන සළසාගෙන නොතිබුණි. එසේ ප්‍රතිපාදන සළසා නොගෙන ජාතික කලා උළෙල පැවැත්වීම සඳහා සළසා තිබුණු ප්‍රතිපාදන මේ සඳහා උපයෝජනය කර තිබුණි.

(ii). ජෝන්ද සිල්වා සමරු රඟහල නවීකරණය කිරීම හා ජාතික කලාභවන ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති සඳහා රු.377,700,000 ක පිරිවැය ඇස්තමේන්තුව අමාත්‍ය මණ්ඩල විසින් අනුමත කර තිබුණි. අදාල කොන්ත්‍රාත්තුව රු.432,977,817 (වැට් සහිත) කට 2014 නොවැම්බර් 04 දින පවරා තිබුණි.

අනුමත ඇස්තමේන්තු සීමාව ඉක්මවූ රු.110,277,817 ක් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි. තවද එම ව්‍යාපෘති සඳහා වූ මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර අනුමැතිය ලබාගෙන නොතිබූ අතර ව්‍යාපෘතියේ පිරිවැය ඉහළ යන විටදී ඒ සඳහා සංශෝධිත පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

## 4.15 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

--------------------------------------

දෙපාර්තමේන්තුවේ වාහන සංචිතයට අයත් මෝටර් රථයක් 2013 වර්ෂයේ සිට 2015 මැයි 11 දින දක්වා කි.මී.77211 ධාවනය කර තිබූ අතර ඉන්ධන සඳහා රු.1,276,077 ක් වැය කර තිබුණි. මෙම මුළු කාලයට අදාල ධාවන සටහන් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබූ අතර මෝටර් රථය යෙදවූයේ කුමන කාර්යයක් සඳහා කාගේ අවශ්‍යතාවයකටද යන්න හා එය භාවිතා කළ නිලධාරියා කවුද යන්න විගණනයේදී තහවුරු නොවුණි. එමෙන්ම වාහනය ධාවනය කිරීමකින් තොරව රු.800,199 ක ඉන්ධන ලබා ගෙන තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 4.16 අනාර්ථික ගනුදෙනු

--------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ අනාර්ථික ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) ජාතික කලාභවන ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියේ කටයුතු අත්හැර දැමීම නිසා එම සැලැසුම් සකස් කිරීමට විශ්ව විද්‍යාලයකට ගෙවා තිබුණු රු.2,837,840 ක්ද, පරීක්ෂණ වාර්තා ලබා ගැනීම සඳහා ගෙවූ රු.217,000 ක්ද, අනාර්ථික ගනුදෙනු බවට පත්ව තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව මගින් පාලනය වන විශ්වකෝෂ කාර්යාලය පවත්වාගෙන යාම සඳහා ගොඩනැගිල්ලක් 2007 ජනවාරි සිට කුලී පදනම මත ලබාගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). වර්ග අඩි 3653 කින් යුත් එම ගොඩනැගිල්ලේ වර්ග අඩි 1138 ක පමණ ඉඩ ප්‍රමාණයක් කුලියට ලබාගත් දින සිටම ඌන උපයෝජිතව පැවතුණි.

(ii). ගොඩනැගිල්ල සඳහා මාසික කුලිය ලෙස 2007 වර්ෂයේ සිට 2013 මැයි දක්වා රු.250,000 බැගින් ගෙවා තිබූ අතර 2013 ජුනි මාසයේ සිට රු.260,000 බැගින් 2015 මැයි මාසය දක්වා ගෙවා තිබුණි. ඒ අනුව මෙම ඉඩ ප්‍රමාණය සඳහා 2007 වර්ෂයේ සිට 2015 මැයි මාසය දක්වා ගෙවා තිබූ රු.7,940,042 ක් අනාර්ථික වියදම් බවට පත්ව තිබුණි.

(iii). 2007 වර්ෂයේ රජයේ තක්සේරුකරුගේ නිර්දේශය අනුව මෙම ගොඩනැගිලි මාසික බදු කුලිය රු.175,000 ක් වුවද, ගොඩනැගිල්ල සඳහා රු.250,000 ක

මාසික කුලියක් ගෙවා තිබීමෙන් 2007 ජනවාරි මාසයේ සිට 2013 ජුනි මාසය දක්වා රජයේ මුදල් රු.5,400,000 ක් වැඩිපුර ගෙවා තිබුණි.

**4.17 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| **සේවක වර්ගය** | | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 28 | 11 | 17 |
| (ii) | තෘතියික මට්ටම | 3 | 2 | 1 |
| (iii) | ද්විතියික මට්ටම | 524 | 457 | 67 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 167 | 118 | 49 |
| | **එකතුව** | **722** | **588** | **134** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 134 ක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. එය අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 18 ක ප්‍රමාණයක් විය. එමෙන්ම දෙපාර්තමේන්තුවේ 28 ක් වූ ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනුමත සේවක සංඛ්‍යාවෙන් 17 ක් පුරප්පාඩුව පැවතීම දෙපාර්තමේන්තුවේ පරිපාලන කටයුතු අයහපත් මට්ටමක පැවතීම සඳහා සෘජුවම බලපා තිබුණි.